www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සසප ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මැතිවරනයට ඉදිරිපත් වෙයි

## SEP stands in Sri Lankan parliamentary election

සමාජවාදි සමානතා පක්ෂයේ ප්‍රකාශය
2010 මාර්තු 02

ජීවන තත්වයන්ට හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එල්ල කෙරෙන එන්ට එන්ටම තියුනු වන ප්‍රහාරයට එරෙහිව, සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත කම්කරු පන්තිය බලමුලු ගැන්වීම සඳහා සමාජවාදී සමානතා පක්ෂය (සසප) අප්‍රේල් 08 දින පැවැත්වෙන මහ මැතිවරනයට ඉදිරිපත් වෙයි. සසප සටන් වදින්නේ, ධනවතුන් අතලොස්සකගේ ලාභය නොව වැඩකරන ජනතාවගේ දැවෙන අවශ්‍යතා සපුරාලිමේ සමාජවාදී ක්‍රියාමාර්ගයක් දියත් කිරීම සඳහා කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් වෙනුවෙනි.

කොලඹ, යුද්ධයෙන් පීඩාවට පත් උතුරේ යාපනය, මධ්‍යම පලාතේ වතුකරයේ නුවර එලිය හා දකුනේ ගාල්ල යන දිස්ත්‍රික්ක සඳහා සසප අපේක්ෂකයන් ඉදිරිපත්කර ඇත. සසප ඉදිරිපත් කර ඇති අපේක්ෂකයන් 58 දෙනාට, වතු හා කාර්මික කම්කරුවන්, ගුරුවරුන්, ධීවරයන්, ගෘහනීන්, රැකියා විරහිතයන්, සිසුන් හා වෘත්තිකයන් ඇතුලත් වෙයි. ඒ ඒ කන්ඩායම්වල නායකත්වය දරන්නේ, කම්කරු පන්තියේ අවශ්‍යතාවන් ආරක්ෂා කිරීමට සිය මුලු වැඩිහිටි ජීවිතයම කැප කලාවූ, විලානි පීරිස්, එස් චන්ද්‍රසේකරන්, එම් දේවරාජා හා රත්නසිරි මලලගම යන අයයි.

මැතිවරනය පැවැත්වෙන්නේ උග්‍ර ආර්ථික හා දේශපාලන අර්බුදයක් මධ්‍යයේය. දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි යුද්ධය පසුගිය මැයි මාසයේ දී අවසන් වූ නමුත්, ජීවන තත්වයන් තියුනු ලෙස අඛන්ඩව පිරිහෙමින් තිබේ. ''සාමය හා සෞභාග්‍යය'' උදාකරන බවට පොරොන්දු වූ ජනාධිපති මහින්ද රාජපක්ෂ, මාධ්‍ය විවේචකයන් නිහඬ කිරීම හා දේශපාලන විරුද්ධවාදීන් අත්අඩංගුවට ගෙන රඳවා තැබීම සඳහා ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවර ගැනීමට නැඹුරුවී සිටියි. ඔහු, පසුගිය වසරේ දී වැටුප් වැඩිවීමක් ඉල්ලා කම්කරුවන් ක්‍රියාත්මක කල වෘත්තීය සමිති අරගලය තහනම් කලේය. ජනවාරි 26 දින ජනාධිපතිවරනයෙන් පසුව, ආන්ඩුව, කුමන්ත්‍රනයක් සැලසුම් කලේය යන ගොතන ලද හා අභූත චෝදනා මත ප්‍රධාන විපක්ෂ ජනාධිපති අපේක්ෂක ජෙනරාල් සරත් ෆොන්සේකා අත්අඩංගුවට ගෙන රඳවා තබා ඇත.

ආන්ඩුව හා විරුද්ධ පක්ෂ අතර තියුනු මතභේද තිබියදීම ඔවුහු, ආර්ථික අර්බුදයේ බර වැඩකරන ජනතාවගේ කර මතට පාත් කිරීම යන මූලික කාරනාව පිලිබඳව ඒකමතිකය. සමස්ත දේශපාලන සංස්ථාපිතයම, මැතිවරනයෙන් පසුව ජීවිතය යහපත් වනු ඇත යන්න විශ්වාසය වගාදිගා කරමින්, වැඩකරන ජනතාව මුලා කිරීමේ උත්සාහයක නිරතව සිටියි. ආන්ඩුව, කිසිදු ආර්ථික ගැටලුවක් නැති බවටත්, ශ්‍රී ලංකාව ''ආසියාවේ නැඟී එන විශ්මය'' වන බවටත් බොරු දෙසාබාමින් සිටියි. එක්සත් ජාතික පක්ෂය (එජාප) හා ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) යන විපක්ෂයේ පක්ෂ දෙකම දුෂ්කරතා තිබෙන බව පිලිගන්නා නමුත්, ආන්ඩුවේ දූෂනය හා නාස්තිය පිටු දැකීමෙන් දිවයින පාරාදීසයක් බවට පත්කල හැකි වනු ඇතැයි ව්‍යාජ ලෙස කියා පාති.

කම්කරු පන්තිය දරුනු කම්පනයකට මුහුනපෑමට නියමිත බවට සසප අනතුරු අඟවයි. 2008 වසරේ පුපුරා ගිය ධනවාදයේ ගෝලීය ආර්ථික අර්බුදය එහි දෙවන අදියරට ඇතුලු වෙමින් තිබේ. බැංකු, මූල්‍යායතන ඇතුලු ව්‍යාපාරවලට ඇපදීම හා උත්තේජක වැඩ සටහන් මඟින් රටක් රටක් පාසා ආන්ඩු, තම ගිනුම් පොත්වලට ඇතුලත් කරගෙන තිබෙන ඩොලර් ට්‍රිලියන ගනනක් වන නය කන්ද, පවත්වා ගෙන යා නොහැකිය. අර්බුදයට තුඩු දුන් මූල්‍ය සමපේක්ෂනයේ මෙම ඉවබවක් නැති ගසාකෑම සඳහා ඔවුන් වගකීමට බැඳී නොසිටියත් මෙම නය බර, දැන් ග්‍රීසියේ සිදුවෙමින් තිබෙන ආකාරයට, වැඩකරන ජනතාවගේ කරමත පැටවීමට සිදු වනු ඇත.

මෙම ගෝලීය ආර්ථික අර්බුදයේ බලපෑමෙන් ගැලවීයාමක් නොව, ශ්‍රී ලංකාව විශේෂයෙන්ම එයට නිරාවරනය වී තිබේ. බලයට පත් කොලඹ ආන්ඩු විසින් ගෙනගිය දිග්ගැස්සුනු සිවිල් යුද්ධයෙන් දිවයිනේ වැඩි කොටසක් විනාශයට ඇද දමා තිබේ. සිය මිලිටරි ආක්‍රමනය සඳහා ගෙවීමට ජනාධිපති රාජපක්ෂ රට

අන්තයටම උකස් තබා ඇති අතර, එහි ප්‍රතිපලය වශයෙන් රාජ්‍ය නය දල දේශීය නිෂ්පාදිතයෙන් (දදේනි) සියයට අනූවක් නැත්නම්, රුපියල් ට්‍රිලියන හතර ඉක්මවා ගොස් තිබේ. ගෝලීය නය අර්බුදය හමුවේ පසුගිය ජූලි මාසයේදී රාජ්‍ය නය පැහැර හැරීමකට තුඩුදිය හැකිව තිබුනු දරුනු ගෙවුම් ශේෂ අර්බුදයක් වලක්වා ගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඩොලර් බිලියන 2.6ක නයක් ගැනීමට රාජපක්ෂට බල කෙරිනි.

මහ බැංකුවේ සහයෝගය ද සහිතව, ආන්ඩුව, රටේ මූල්‍ය තත්වය සිතා මතාම වසංකර තිබේ. රාජපක්ෂ මැතිවරනය අවසන් වන තෙක් අයවැය කල්දමා ගත්තේය. අයවැය හිගයේ තරම පිලිබඳ අලුත්ම සංඛ්‍යා ලේඛන ඇත්තේ නැත. එක් ගනන් බැලීමකට අනුව එය සියයට 11.3 කි. 2011 දී අයවැය හිගය සියයට 5 දක්වා කපාහරින ලෙස නිර්දේශ කරන ජාමූඅ, ආන්ඩුව එහි ඉලක්ක සපුරා නැති නිසා තෙවන නය වාරිකය නිදහස් කිරීම ප්‍රමාදකර ඇත.

අයවැය හිගය අඩකටත් වැඩියෙන් කපා හැරීමේ ප්‍රතිවිපාක ග්‍රීසිය තුල දැනටමත් දැකගත හැකිව තිබේ. එහිදී ආන්ඩුව, රාජ්‍ය අංශයේ වැටුප් කැටිකිරීම, සිවිල් සේවයේ පාරිතෝෂික පොදුවේ සියයට 20කින් කැපීම, විශ්‍රාම ගන්නා වයස් සීමාව දෙවසරකින් දීර්ඝ කිරීම, ඛනිජ තෙල්, මද්‍යසාර හා දුම්කොල සඳහා වැට් නොහොත් එකතුකල අගය මත බදු වැඩිකිරීම ද ක්‍රියාවට දමා තිබේ. තරුනයන් අතර නිල විරැකියව සියයට 35.4ක් ද දැනටමත් ජනගහනයෙන් සියයට 15ක් නිල දරිද්‍රතා මට්ටමට පහලින් ජීවත්වන්නා වූ ද සෞඛ්‍ය හා අධ්‍යාපනය වැනි අත්‍යවශ්‍ය සේවා කප්පාදු කර ඇත්තා වූ ද තත්වය හමුවේ මෙරට තුල "ග්‍රීක විසඳුම" ක්‍රියාවට නැගීම, විනාශකාරී කොන්දේසි ගෙන එනු ඇත.

ජාතිය යලි ගොඩනැගීම සඳහා ''ආර්ථික යුද්ධයක්'' ගෙනයාමේ සිය අභිලාෂය රාජපක්ෂ ප්‍රකාශයට පත්කර තිබේ. වැඩකරන ජනතාවගෙන් නැගෙන කුමන හෝ විරෝධයක් නිර්දය ලෙස මැඩීම සඳහා එල්ටීටීඊය සමග පුරා වසර 26ක් පැවති යුද්ධය තුල දී ගොඩනගාගත් පොලිස් රාජ්‍ය ක්‍රමවේදයන් ඔහු යොදාගනු ඇති බවට සසප අනතුරු අඟවා සිටියි. යුද්ධය අවධියේ දී වර්ජක කම්කරුවන් හා විරෝධතාවයේ යෙදුනු සිසුන් ජාතික ආරක්ෂාවට වලකපන්නන් බව පවසමින් ජනාධිපති ඔවුන් හෙලා දුටුවේය. ඔහුගේ ''ජාතිය ගොඩනැගීමේ'' කප්පාදු පිලිවෙත් ක්‍රියාවට නැගීමට විරුද්ධ වන ඕනෑම අයෙකු මත දේශද්‍රෝහී හංවඩුව ගැසීමට ඔහු නොපසුබට වනු ඇත.

ජනාධිපතිවරනයෙන් පසුව ආන්ඩුව වැඩපොලවල් තුල, මාධ්‍යවල, මිලිටරියේ හා පොලිසියේ ඉහල ස්ථරයන් ද ඇතුලු ෆොන්සේකාගේ ආධාරකරුවන්ට හා විරුද්ධ පක්ෂවලට එරෙහිව පුලුල් මර්දන ව්‍යාපාරයක් දියත් කලේය. කටුක දේශපාලන කුලල්කා ගැනීම් තිබිය දී වුවත් ආන්ඩුව හා විරුද්ධ පක්ෂ අතර ඇත්තේ උපායික ස්වභාවයේ මතභේද පමනි. ඒ විශේෂයෙන්ම, මහ බලවතුන්ගේ උත්සන්න වන එදිරිවාදිකම් මධ්‍යයේ රටේ විදේශ ප්‍රතිපත්තියේ දිශානතිය කෙසේ සකස් විය යුතු ද යන්න පිලිබඳව ය.

එක්සත් ජනපදයේ ඓතිහාසික පරිහානිය ද චීනය හා ඉන්දියාව වැනි නව බලවතුන්ගේ නැගී ඒම ද ලෝක දේශපාලනය තුල, විශේෂයෙන් ම දකුනු ආසියාවේ, ප්‍රගාඪ අස්ථාවරකාරී සාධකයක් බවට පත්ව තිබේ. එක්සත් ජනපදයේ ජනාධිපති ඔබාමාගේ උත්සන්න කල ඇෆ්ගනිස්ථාන යුද්ධයේත්, පකිස්ථානය තුල සිය ඒජන්තයන් ලවා ගෙන යනු ලබන යුද්ධයේත් අරමුන වන්නේ, මධ්‍යම ආසියාවේ හා මැද පෙරදිග ප්‍රධාන මූලෝපායික කලාපයන්හි ඇමරිකානු බලපෑම ව්‍යාප්ත කිරීමයි. මැද පෙරදිග හා අප්‍රිකාවේ බල ශක්ති හා සම්පත් මත රැඳී සිටින චීනය, ඉන්දියානු සාගරය හරහා දිවෙන නැව් මාර්ග ද ඇතුලත් සිය වෙලඳ මාර්ග සුරක්ෂිත කර ගැනීමේ උත්සාහයක නිරතව සිටියි. ඉන්දියාව මෙම කලාපය තමන්ගේම බල වැයික්කිය ලෙස සලකයි.

ශ්‍රී ලංකාව මෙම තරගකාරිත්වය තුලට වඩවඩාත් ගසාගෙන යමින් තිබේ. සිය වර්ගවාදී යුද්ධයේ දී රාජපක්ෂ ආයුධ, මූල්‍යාධාර හා දේශපාලන සහයෝගය සඳහා චීනය වෙත නැඹුරු වූ අතර එයට හිලව් වශයෙන් චීනයට, තීරනාත්මක වැදගත් කමක් දරන හම්බන්තොට නව වරාය පහසුකම් ගොඩනැගීම ද ඇතුලත්, ආර්ථික හා මූලෝපායික අවස්ථා ලබා දුනි. චීනයේ සහයෝගය මත විශ්වාසය තැබූ රාජපක්ෂ, මිලිටරියේ යුද අපරාධ පිලිබඳව එල්ල වූ ජාත්‍යන්තර විවේචන, ''බටහිර කුමන්ත්‍රනයක්'' ලෙස හෙලා දුටුවේ ය. අනෙක් අතට ෆොන්සේකා, ජනාධිපතිවරනය තුල දී, ''ජාත්‍යන්තර ප්‍රජාව'' වෙතින් ඈත්වෙමින් ද යුරෝපා සංගමයේ වෙලඳ සහන අනතුරේ හෙලා ද ඇතැයි රාජපක්ෂ විවේචනය කරමින්, එක්සත් ජනපදයේ හා යුරෝපයේ ශ්‍රී ලංකාවෙහි සම්ප්‍රදායික මිතුරන් වෙත වාරුවන බවක් පෙනී ගියේය.

ෆොන්සේකා හා විරුද්ධ පක්ෂ මත රාජපක්ෂගේ කඩාපැනීමෙහි මුඛ්‍ය ඉලක්කය වන්නේ කම්කරු පන්තිය සමඟ ගැටුමකට සූදානම් වීමේ දී ඔහුගේ තත්වය තහවුරුකර ගැනීමයි. යුද්ධය අවසන්ව තිබියදීත් පාර්ලිමේන්තුවේ සෑම පක්ෂයකම පාහේ සහයෝගය ඇතිව ඔහු හදිසි නීතිය තවමත් පවත්වාගෙන යයි. යුද්ධය පැවති අවධියේ දී නෛතික දන්ඩනයකට යටත් වීමේ මොනම බියකින් වත් තොරව සිය ගනනක් මිනිසුන් මරාදැමූ ආන්ඩුවට ගැති ඝාතක කල්ලි තවමත් ක්‍රියාකාරීව සිටිති.

සිය පලමු නිල කාලය තුලදී රාජපක්ෂ, ඔහු සතු පුලුල් විධායක බලතල පාවිච්චි කරමින් පාර්ලිමේන්තුව හුදු රබර් මුද්‍රාවක් බවට පත් කලේය. ඔහු වඩවඩාත් රැ දී ගත්තේ ඥාතීන්ගෙන්, සමීප උපදේශකයන්ගෙන්, හමුදා ජෙනරාල්වරුන්ගෙන් හා ඉහල නිලධාරීන්ගෙන් සැදුම් ලත් දේශපාලන-මිලිටරි කල්ලියක් මත ය. පාර්ලිමේන්තු මැතිවරනය කෙරෙහි රාජපක්ෂට ඇති උනන්දුව තුල ප්‍රමුඛත්වය දරන්නේ, සිය අභිමතය පරිදි ව්‍යවස්ථාව වෙනස්කිරීම සහ ඔහුගේ පොලිස් රාජ්‍ය පාලනය තහවුරුකර ගැනීම සඳහා තුනෙන් දෙකක බහුතරයක් හිමිකර ගැනීමයි.

විපක්ෂයේ එජාප හා ජවිපෙ කෙරෙහි කම්කරුවන් කිසිදු විශ්වාසයක් නොතැබිය යුතුය. ඔවුහු සෑම මූලික කාරනාවක දී ම, විශේෂයෙන්ම, දෙමල සුලුතරය මැඬීමේ රාජපක්ෂගේ වර්ගවාදී යුද්ධය ද රටේ ධනවාදය නඟා සිටුවීමේ ඔහුගේ ආර්ථික පිලිවෙත් ද සම්බන්ධයෙන්, රාජපක්ෂ තන්ත්‍රය සමග එකඟ ය. එක්සත් ජාතික පෙරමුන (එජාපෙ) හා ජවිපෙ යන දෙපක්ෂයම, ජනාධිපතිවරනයේ දී, සංගත ප්‍රභූ පැලැන්තිය ඉල්ලුම් කල න්‍යාය පත්‍රය ඉදිරියට තල්ලු කල හැකි විකල්ප ආඥාදායකයකු ලෙස, රාජපක්ෂගේ යුද්ධය ක්‍රියාවට දැමූ එවකට හමුදාපති ජෙනරාල් ෆොන්සේකාට සහාය දුන්හ. රාජපක්ෂට ප්‍රජාතන්ත්‍රවාදී විකල්පයක් ලෙස ෆොන්සේකා හුවා දැක්වීමට එජාපෙට හා ජවිපෙට හැකියාව ලැබුනේ, නිර්ලජ්ජිත ලෙස මෙම දක්ෂිනාංශික පක්ෂ සමඟ පෙලගැසුනු නව සමසමාජ පක්ෂයේ හා එක්සත් සමාජවාදී පක්ෂයේ හිටපු වම්මුන්ට පින්සිදු වන්නටය.

සියවස් කාලක් පුරා පැවති කුරිරු සිවිල් යුද්ධය, ජාතිකවාදයේ හා වර්ගවාදයේ සියලු රූපාකාරයන්ගේ ප්‍රතිගාමී ස්වභාවය එලිමහනට පමුනුවා තිබේ. බලයට පත් සෑම කොලඹ ආන්ඩුවක්ම වැඩකරන ජනතාව බෙදීම සඳහා දෙමල විරෝධී වෛරය ඇවිස්සූ අතර, 75,000කට අධික ජනතාවකගේ ජීවිතවලින් වන්දි ගෙවූ සාපරාධී යුද්ධය පිලිබඳව ඔවුහු වගකිව යුතුය. කෙසේ වෙතත්, දෙමල ජනතාවගේ නොව, දෙමල ධනේශ්වරයේ අවශ්‍යතාවන් නියෝජනය කල එල්ටීටීඊයේ දෙමල බෙදුම්වාදී ක්‍රියාමාර්ගය ප්‍රගතිශීලී විකල්පයක් නොවීය. එල්ටීටීඊයේ මිලිටරි පරාජය, අවසාන වශයෙන් එහි දේශපාලන බංකොලොත්කමේ ප්‍රතිඵලයක් විය. දෙමල ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කිරීමෙහි සමත් එකම සමාජ බලවේගය වන කම්කරු පන්තියට කිසිදු පන්ති ආයාචනයක් කිරීමෙහිලා එය ඓන්ද්‍රීයවම නොසමත් විය.

කම්කරුවන් අවශ්‍ය පාඩම් උකහාගත යුතුය. එහි අවශ්‍යතා ආරක්ෂාකරගත හැක්කේ, පාර්ලිමේන්තු සංයෝජනවල හා උපාමාරුවල දේශපාලනයෙන් නොවේ. සංගතවල ලාභය නොව සිය සමාජ අවශ්‍යතා සපුරාගැනීම සඳහා සමාජය සමස්තයක් ලෙස ප්‍රතිව්‍යුහගත කිරීමේ අරමුන සහිත සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත තමන්ගේම ස්වාධීන බලමුලු ගැන්වීමක් මගින් පමනි. එවන් අරගලයක් සඳහා මූලික වන්නේ, සිංහල, දෙමල හා මුස්ලිම් කම්කරුවන් ඔවුන්ගේ පොදු පන්ති අවශ්‍යතා සඳහා සටන තුල එක්සත් කිරීමේ අවශ්‍යතාවයි. යුද්ධයෙන් පීඩාවට පත් දිවයිනේ උතුරෙන් හා නැගෙනහිරෙන් සියලු හමුදා ඉවත්කරගත යුතු බව සසප කියා සිටියි.

සසප අප්‍රේල් 08 දින මැතිවරනයට ඉදිරිපත් වන්නේ, ජීවන තත්වයන් හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන් මත ලඟදෙමින් තිබෙන ප්‍රහාරය පිලිබඳව වැඩකරන ජනතාවට අනතුරු අඟවමින් ඔවුන් උගන්වා ගැනීමටත්, දශක ගනනාවක් තිස්සේ මඬිනු ලැබ පවතින පන්ති අරගලයේ ක්‍රමවේදයන් ඊට එරෙහිව යලිපනගැන්වීම සඳහාත් ය. අපගේ අපේක්ෂකයෝ, වැඩකරන ජනතාවගේ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා වැඩපලවල ද කම්කරු පන්තික නිවහන් ප්‍රදේශයන්හි ද නඟරවල හා ගම්වල ද ක්‍රියාකාරී කමිටු ගොඩනැඟීම දිරිමත් කිරීමට මේ උද්ඝෝෂනය ඉවහල් කරගනු ඇත. එවන් පියවරක් සඳහා, බංකොලොත් ලාභ පද්ධතියට කම්කරු පන්තිය ගැටගසා තබන දේශපාලන පක්ෂවලින් ද වෘත්තීය සමිතිවලින් ද පූර්න දේශපාලනික බිඳී වෙන්වීමක් ඉල්ලා සිටියි.

කම්කරු පන්තිය සත්‍ය තත්වයට මුහුන දිය යුතුය. එනම්, ධනවාදී පද්ධතිය අසාර්ථකවී ඇති බවත්, නව හා වඩාත් බිහිසුනු යුද්ධ, ව්‍යසනකාරී දේශගුනික විපර්යාස හා මහජනතාවන්ගේ සමාජ දුගීභාවය හැරෙන්නට මනුෂ්‍ය වර්ගයාට අන් කිසිවක් ලබාදීමට එයට නොහැකිවී ඇති බවත්ය. මෙරට වැඩකරන ජනතාවට සිය මූලික අයිතීන් සුරක්ෂිත කරගත හැක්කේ, දකුනු ආසියාවේ හා ජාත්‍යන්තරව සමාජවාදය සඳහා වඩා පුලුල් අරගලයක කොටසක් ලෙස, ශ්‍රී ලංකා ඊලම් එක්සත් සමාජවාදී සමූහාන්ඩුවක රූපයෙන් කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් සඳහා අරගලයට ගම්බද ජනතාව දිනාගැනීමට සටන් වැදීමෙන් පමනි. අපගේ ක්‍රියාමාර්ගය අධ්‍යයනය කරන ලෙසත්, අපගේ දේශපාලන ලිපිලේඛන බෙදාහරිමින්, අපගේ අපේක්ෂකයන්ට ඇමතිය හැකි රැස්වීම් සංවිධානය කරමින්, අපගේ මැතිවරන අරමුදලට මුදල් පරිත්‍යාග කරමින් සහ අන් සියල්ලටත් වඩා සමාජවාදී සමානතා පක්ෂයට බැඳෙමින් අපගේ මැතිවරන උද්ඝෝෂනයට ක්‍රියාකාරීව සහයෝගය දෙන ලෙසත් අපි කම්කරුවන්ගෙන් හා තරුනයන්ගෙන් ඉල්ලා සිටිමු.